**මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය ) III අදියර - 2017.**

---

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය ) **III** අදියර 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මෙම ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන ආනයන හා අපනයන බැංකුව සමඟ 2014 සැප්තැම්බර් 16 දින ඇතුලත් වූ අංක පිබීසී (2014) 15 එකතු අංක (309) දරන ණය ගිවිසුම යටතේ කඩවත සිට කෙරවලපිටිය දක්වා පිටත වටරවුම් මහාමාර්ග අදියර III ඉදිකිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘති ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග, මාර්ග සංවර්ධන හා ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, කොළඹ ප්‍රධාන නගරයේ ප්‍රවාහන තදබදය අඩු කිරීමට හා රටේ අනිකුත් ප්‍රදේශවලට සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ගයට, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයට සහ කොළඹ නගරයෙන් පිටතට යන අනෙකුත් ජාතික මාර්ගවලට සම්බන්ධ කෙරෙන කොළඹ නගරයෙන් බැහැර අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුලින් ශ්‍රී ලංකාවේ පලාත් අතර ආර්ථික සංවර්ධනය ශක්තිමත් කිරීමට දායක වීමය. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 76,200 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 590 ක් වූ අතර ඉන් රු.මිලියන 63,356 කට සමාන එ.ජ.ඩො. මිලියන 494 ක් මූල්‍යායනය කිරීමට චීන ආනයන හා අපනයන බැංකුව එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු ආරම්භ කර තිබුණු අතර 2019 ජුනි වන විට අවසන් කිරීමට අපේක්ෂිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක්

ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් හා ණය දෙන ආයතනවලින් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති වලට අනුකූලව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ගිණුම්කරණ වැරැද්දක් හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු කොන්ත්‍රාත්කරුවන්ගේ ශේෂය රු. මිලියන 1,613.19 කින් වැඩියෙන් සහ විදේශ ණය ගිණුමේ ශේෂය එම වටිනාකමෙන්ම අඩුවෙන් පෙන්වා තිබුණ බව නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6,063.42 ක්වූ අයකර ගතයුතු පූර්ව අත්තිකාරම් ශේෂය ගිණුම්කරණ වැරැද්දක් හේතුවෙන් රු.මිලියන 1,536.18 කින් අඩුවී තිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශන තුල රඳවාගත් මුදල් යටතේ පෙන්වා ඇති ශේෂයද මීට සමානම වැරැද්දක් හේතුවෙන් රු.මිලියන 6,256.02 කින් වැඩි වී තිබුණි.

**2.2.2 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ පරිච්ඡේද අංක 8.3.9 හි සඳහන් විධිවිධාන වලට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘතිය විසින් පොදුකාර්ය වියදම් රු.මිලියන 1.91ක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ප්‍රේෂණය කර තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුල හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් දත්ත සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූලායනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම් | අරමුදල් උපයෝජනය 2017 වර්ෂය තුල | | 2017 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| එක්සිම් බැංකුව | 494 | 63,356 | 12,070 | 78.93 | 12,065 | 137.05 | 20,950 |
| ශ්‍රී.ලං.ර | 96 | 12,844 | 593 | 3.15 | 482 | 60.77 | 9,289 |
| එකතුව | 590 | 76,200 | 12,663 | 82.08 | 12,547 | 197.82 | 30,239 |

## 3.2 භෞතික ප්‍රගතිය

ලැබී ඇති තොරතුරු අනුව, 2013 ජනවාරි 31 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ, මහාමාර්ගය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2013 පෙබරවාරි 21 දින රු.මිලියන 66,690 ක පිරිවැයකට ස්වකීය පදනම (Unsolicited Basis) මත තෝරාගත් විදේශීය සමාගමකට පිරිනමා තිබුණි.කොන්ත්‍රාත්කරු 2014 අගෝස්තු මාසයේ වැඩ ආරම්භකර තිබුණේ වුවද රටේ පැවති දේශපාලන වාතාවරනය හා විෂය පථයේ වූ වැඩවල පසුව සිදු වූ වෙනස්කම් හේතුවෙන් ඊට අදාල වැඩ පමණක් 2016 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණි. දුර්වල සැලසුම් හා කොන්ත්‍රාත්කරු විසින් සම්පත් ප්‍රමාණවත් ලෙස නොයෙදවීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට මහාමාර්ගයේ ඉදිකිරීම් වැඩ වල සමස්ථ ප්‍රගතිය සියයට 53.99 ක් අපේක්ෂිත වූ අතර ඊට එරෙහිව සියයට 43.13 ක්ව පැවතුණි. තවද, 2017 දෙසැම්බර් ප්‍රගති වාර්තා අනුව ව්‍යාපෘතිය හා කොන්ත්‍රාත්කරු විසින් යොදාගන්නා ලද නිර්මාණ ඉංජිනේරුවන්ගේ හිඟය හේතුවෙන්, 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට නියමිත වූ සැලසුම්කරණ කාර්යයන් 154 න් සැලසුම්කරණ කාර්යයන් 64 ක භෞතික ප්‍රගතියක් වාර්තාකර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයිතම කිහිපයක් සඳහා ඉහල අනුපාතයන් භාවිතා කර ප්‍රමාණ බිල්පත් සැකසීම හේතුවෙන් පිටත වටරවුම් මහාමාර්ග අදියර III ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ එකඟවී ඇති පිරිවැය, අනෙකුත් මහාමාර්ග අදියරයන්හි ඉදිකිරීමේ පිරිවැයන් සමඟ සැසඳීමේදී ඉහල අගයක පවතින බව නිරීක්ෂණය විය.විස්තර පහත දැක්වේ.

| මහාමාර්ග කොටස | දුර | කිලෝමීටරයකට පිරිවැය |
|---|---|---|
| | කිලෝමීටර | රු.මිලියන |
| අදියර I - කොට්ටාව සිට කඩුවෙල | 11.00 | 2,271 |
| අදියර II - කඩුවෙල සිට කඩවත | 8.90 | 6,971 |
| අදියර III - කඩවත සිට කෙරවලපිටිය | 9.32 | 7,155 |

(ආ) මූලික ප්‍රමාණපත්වල ඇතුලත් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 10,775 ක් වූ, කෙරවලපිටිය අන්තර් හුවමාරු මධ්‍යස්ථානය පිහිටි කොටසෙහි සහ අභ්‍යන්තර මංතීරු 04 ඉදිකිරීම යටතේ වූ වැඩ අවලංගු කර තිබූ අතර කඩවත අන්තර් හුවමාරු මධ්‍යස්ථානයේ ඉදිකිරීම්, නව ආරම්භක ස්ථානය කි.මී.0+980 සහ මහාමාර්ගයේ කි.මී.7+900 සිට 8+543 දක්වා කුලුණු මතින් ඉදිකිරීම යන නව වැඩ පසුව හඳුන්වා දී තිබූ බව නිරීක්ෂණය විය. තවද, ප්‍රමාණ බිල්පත්‍රය අනුව ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 5,188.31කට අයිතම 74 ක් යටතේ සිදු කිරීමට නියමිතව තිබූ භූමි වැඩ සහ වෙනත් ඉදිකිරීම් වැඩ 2017 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.4 මානව සම්පත් කළමනාකරණය

ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින්, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත සැලසුම්කරණ සහ ව්‍යාපෘති මෙහෙයුම් උපදේශකයකු සේවයේ යොදවා තිබුණ අතර සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 4.70ක් පාරිතෝෂික ලෙස ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.5 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු

ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ණය ගිවිසුමේ 2.2.7 ඡේදය අනුව ණය මුදලේ ඌන උපයෝජිත ශේෂය මත බැඳීම් ගාස්තු රු.මිලියන 91.63 ක් ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් අයකරගෙන තිබුණි.

### 3.6 ඉඩම් අත්පත් කරගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කටයුතු පිළිබඳ ගැටළු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් වත්තල හා මහර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය යටතේ වූ රජයේ ඉඩම් කැබලි 296 ක් ඇතුලුව ඉඩම් කැබලි 1,280 ක් මාර්ගය ඉදිකිරීමේ අරමුණින් අත්පත්කර ගෙන තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6,313.70 ක් වන්දි ලෙස ගෙවා තිබුණි. කෙසේවුවද, ඉඩම් කැබලි 245 ක අයිතිය පමණක් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මාරු කර තිබුණි.

(ආ) වන්දි ඉල්ලීම් නිරවුල් කිරීමේ ප්‍රමාදය හේතුවෙන්, 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් පොළිය ලෙස රු.මිලියන 1,066 ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. තවද, මහාමාර්ග අමාත්‍යාංශයේ 2007 ජනවාරි 10 දිනැති අංක 11 දරන චක්‍රලේඛය මගින් ලබාදී ඇති විධිවිධාන අනුව, ඉඩම් හා ගොඩනැගිලි වල ව්‍යවස්ථාපිත වටිනාකම මත වූ වන්දි තක්සේරුවෙන් සියයට 40 දක්වා වැඩි කිරීමට ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුවට හැක. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී, ඉහත සඳහන් උපදෙස් වලට පටහැනිව

සමාලෝචිත වර්ෂය තුලදී අදාල සියයට 40 සීමාව ඉක්මවා අවස්ථා 08 කදී වන්දි එකතුව රු.මිලියන 8.06ක් ගෙවා තිබුණ බව අනාවරණය විය. තවද, විශේෂ ඉඩම් අත්පත් කරගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුව විසින් අනුමත කල ගෙවීම් පිළිබඳව සිදු කල පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂය තුලදී, අවස්ථාවන් 05 කදී ඉඩම් අත්පත් කර ගැනිමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුව විසින් අනුමත කර තිබූ වන්දි මුදල් සියයට 55 සිට 179 දක්වා පරාසයකින් ඉහළ දැමීමට අනුමැතිය ලබාදී තිබූ බව අනාවරණය විය.

(ඈ) ව්‍යාපෘතිය වත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ හෙක්ටෙයාර 2.63 කින් යුත් මිල්ලගහවත්ත නම් ඉඩම රු.මිලියන 34 ක පිරිවැයකට අත්පත් කරගෙන තිබූ අතර රු.මිලියන 48.37 ක් නැවත පදිංචි කිරීමේ අරමුණ සඳහා ඉඩම වැඩිදියුණු කිරීමට වැය කර තිබුණි. ව්‍යාපෘතිය පවුල් 57 ක් නැවත පදිංචි කිරීමට අපේක්ෂා කලද, 2017 දෙසැම්බර් 31 දිනට පවුල් 28 ක් පමණක් නැවත පදිංචි වී තිබුණි.

(ඇ) ව්‍යාපෘතිය විසින් හෙක්ටෙයාර 2.43 කින් යුත් ජයසුමනවත්ත නම් ඉඩම නැවත පදිංචි කිරීමේ අරමුණ සඳහා රු.මිලියන 96.19 ක පිරිවැයකට 2014 වර්ෂයේදී ප්‍රසම්පාදනය කර තිබුණි. ලැබී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් නැවත පදිංචි කරන ලද පවුල් 36 කගෙන් ඉඩම් කැබලි වල පිරිවැය වාරික පදනම මත අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන තිබුණි. කෙසේවුවත්, 2017දෙසැම්බර් 31 දිනට පවුල් 07 කින් රු.මිලියන 14.24 ක් පමණක් අයකරගෙන තිබුණි. තවද, ව්‍යාපෘතිය ඉඩම් කැබලි 58 ක් අනවසර පදිංචිකරුවන්ට පවරාදීමට එකඟවී තිබුණ අතර 2018 ඔක්තෝබර් 30 දිනට එයින් පවුල් 33 ක් පමණක් අදාල ඉඩම් කැබලි වල නැවත පදිංචි වී තිබුණි.

**3.9 පාරිසරික හා ආරක්ෂක කළමනාකරණ ගැටළු**

**-----------------------------------------------**

වැඩ බිම තුල අපද්‍රව්‍ය ගොඩගසා තිබීම, අපවහන සහ ඇලමාර්ග අවහිර කිරීම සහ වැසි ජලය සම්මිශ්‍රණ ටැංකි (Admixture Tanks) තුල එකතු වීම වැනි විවිධ පාරිසරික හා ආරක්ෂක ගැටළු නිසා සමාලෝචිත වර්ෂය තුල මාර්ගය භවිතා කරන්නන් සහ ප්‍රදේශවාසින් විසින් විරෝධතා ඇති කර තිබුණු අතර ප්‍රමාණ බිල්පත්‍ර මඟින් රු. මිලියන 103 ක් වෙන් කර තිබුණද, එබඳු ගැටළු අධීක්ෂණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බවට නිරීක්ෂණය විය.